කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E3045 - පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. "කළමනාකරණ ගිණුම්කරණය " සහ " පිරිවැය ගිණුම්කරණය " යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

(ලකුණු 05)

ආ. මූල්‍ය ගිණුම්කරණයේ සහ කළමනාකරණ ගිණුම්කරණයේ වෙනස්කම් පෙන්වන්න.

(ලකුණු 05)

ඇ. " පිරිවැය කේන්ද්‍රස්ථානය " (Cast Center) සහ " පිරිවැය වස්තුව" (Cost Object) යන පද උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඉ. පිරිවැය වර්ගීකරණය කළ හැකි ආකාර උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

02. බිලූ ජීන් සමාගම ඔවුන්ගේ ගබඩාවේ සහ බෙදාහැරීමේ මධ්‍යස්ථානවල පිරිවැය ඔවුන්ගේ පාරිභෝගිකයන් මත ක්‍රියාකාරිත්ව පදනමවූ පිරිවැය (Activity Based Costing) ක්‍රමයක් මගින් වෙන්කර පාරිභෝගික ලාභදායිත්වය ඉතා හොඳින් ගණනය කිරීමට තීරණය කර ඇත. ගබඩා කළමනාකරු ආර්ථික වශයෙන් සාධ්‍ය ලෙස පාරිභෝගිකයන්ට සෘජුවම ගලපා ගත හැකි එකම ඒකකය පිටතට භාණ්ඩ ගෙනයාමේ පිරිවැය බව තීරණය කරයි. කළමනාකරු එයද සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පොදුකාර්ය පිරිවැය සංසදයන් පහත සඳහන් පිරිවැය ඒකකයන් මගින් පාරිභෝගිකයන්ට අනුමත කිරීමට තිරණය කරයි.

| | | |
|---|---|---|
| පොදුකාර්ය පිරිවැය සංසදයන් | - | පිරිවැය ඒකකයන් |
| ඇණවුම් සැකසීමේ දෙපාර්තමේන්තුව | - | ඒ පාරිභෝගිකයා සඳහා සකසන ලද තනි ඇණවුම් ගණන |
| ඇණවුම් පිරවීමේ දෙපාර්තමේන්තුව | - | ඒ පාරිභෝගිකයා සඳහා පුරවන ලද ඇණවුම් ගණන |
| තත්ව පාලන දෙපාර්තමේන්තුව | - | ඒ පාරිභෝගිකයා සඳහා නැව්ගත කරන ලද සනකම් පෙට්ටි ගණන |

| | | |
|---|---|---|
| නැව්ගත කිරීමේ දෙපාර්තමේන්තුව | - | ඒ පාරිභෝගිකයා සඳහා නැව්ගත කරන ලද සනකම් පෙට්ටි ගණන. |

එක් එක් පොදුකාර්ය පිරිවැය සංසදයන් වලට අදාල දත්ත පහත දැක්වේ.

ඇණවුම් සැකසීමේ දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| එම දෙපාර්තමේන්තුවේ මුළු පිරිවැය | රු. 3,000,000 |
| සකසන ලද මුළු ඇණවුම් ගණන | 200,000 |

ඇණවුම් පිරවීමේ දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| එම දෙපාර්තමේන්තුවේ මුළු පිරිවැය | රු. 4,000,000 |
| පුරවන ලද මුළු ඇණවුම් ගණන | 4,000,000 |

තත්ව පාලන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| එම දෙපාර්තමේන්තුවේ මුළු පිරිවැය | රු. 500,000 |
| නැව්ගත කරන ලද මුළු සනකම් පෙට්ටි ගණන | 2,000,000 |

පාරිභෝගිකයන් දෙදෙනෙකුට අදාල තොරතුරු පහත දැක්වේ.

7-9-11 ඉස්ටෝරුව

| | |
|---|---|
| වර්ෂයට අදාල විකුණුම් ආදායම | රු 2,400,000 |
| සකසන ලද ඇණවුම් ගණන | 500 |
| පුරවන ලද ඇණවුම් ගන්න | 100,000 |
| නැව්ගත කරන ලද සනකම් පෙට්ටි ගණන | 50,000 |
| පිටතට ගෙනයාමේ ප්‍රවාහන පිරිවැය | රු. 75,000 |

මෙන්ස් ලාර්ජ් ඇන්ඩ් බිග් ස්ටෝර්ස්

| | |
|---|---|
| වර්ෂයට අදාල විකුණුම් ආදායම | රු. 1,500,000 |
| සකසන ලද ඇණවුම් ගණන | 250 |
| පුරවන ලද ඇණවුම් ගන්න | 20,000 |
| නැව්ගත කරන ලද සනකම් පෙට්ටි ගණන | 40,000 |
| පිටතට ගෙනයාමේ ප්‍රවාහන පිරිවැය | රු. 56,000 |

කළයුතු දෑ

අ. පොදුකාර්ය පිරිවැය සංසදයන් හතර සඳහා වන පොදුකාර්ය අනුපාතිකයන් ගණනය කරන්න.

(ලකුණු 04)

ආ. 7-09-11 ස්ටෝරුව සඳහා අදාල වන මුළු පොදුකාර්ය පිරිවැය ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 08)

ඇ. මෙන්ස් ලාර්ජ් ඇන්ඩ් බිග් ස්ටෝර්ස් සඳහා අදාල වන මුළු පොදුකාර්ය පිරිවැය ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. ලංකා නිෂ්පාදකයන් විසින් ඔබට මුදල් අයවැය ලේඛනය පිළියෙල කර ජූනි සිට ඔක්තෝම්බර් සඳහා වන කාලපරිච්ඡේදයට ලබාගත යුතු ණය ප්‍රමාණය තීරණය කිරීමට පවසා ඇත. ඔබ පහත සඳහන් තොරතුරු රැස්කර ගෙන ඇත.

| මාසය | විකුණුම් (රු) | අනෙකුත් ගෙවීම් (රු.) |
|---|---|---|
| ජූනි | 160,000 | 80,000 |
| ජූලි | 130,000 | 65,000 |
| අගෝස්තු | 95,000 | 60,000 |
| සැප්තැම්බර් | 84,000 | 45,000 |
| ඔක්තෝම්බර් | 76,000 | 84,000 |
| නොවැම්බර් 2013 | 90,000 | |

මාර්තු සහ අප්‍රේල් මාස සඳහා විකුණුම් පිළිවෙලින් රු. 125,000 සහ රු. 140,000 වේ. ව්‍යාපාරය තමන්ගේ විකුණුම් වලින් 30% එම විකුණුම් වලට අදාල මාසය තුලද 60% පසු මාසය තුලද 10% එම විකුණුම් වලින් මසා 2 පසුව එකතු කරගනු ලැබේ. සෑම මාසයක් තුලම අනෙක් මාසයේ අපේක්ෂිත විකුණුම් වලින් 65% සමාන ප්‍රමාණයක් තොග ලෙස මිලදී ගැනීම් සිදුකරයි. ව්‍යාපාරය තම තොග මිලදී ගැනීමේ ගෙවීම් වලින් 40% එම මාසය තුලද 60% පසු මාසය තුලද සිදු කරයි.

තවද ව්‍යාපාරයේ සැපයුම්කරුවන් විසින් අදාල මාසයේ මිලදී ගැනීම සඳහා එම මාසය තුලම ගෙවීම් කරන විට 2% වට්ටමක් දෙනු ලැබේ. සෑම මාසයක් තුලට රු. 25,000 අවම මුදල් ශේෂයක් පවත්වාගෙන යා යුතු අතරම බැංකුවෙන් කෙටි කාලීන ණය ගැනීම 8 % වාර්ෂික පොළියක් ගෙවිය යුතු වේ.

කළයුතු දේ.

අ. 2013 ජූනි සිට ඔක්තෝම්බර් සඳහා වන මුදල් අයවැය ලේඛනය පිළියෙල කරන්න. මුදල් අයවැය ලේඛනය තුල කෙටිකාලින ණය ගැනීම් සහ පවත්නා ණය පියවීම් පෙන්වන්න. මැයි මාසය අවසානයේ ව්‍යාපාරයේ රු. 30,000 මුදල් ශේෂයක් පවති.

(ලකුණු 14)

ආ. ඕනෑම ව්‍යාපාරයක් සඳහා මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමේ වාසි සහ අවාසි මොනවාද ?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

04. අ. සමාගමක් ඒකක 300,000 ක් නිෂ්පාදනය සඳහා අයවැයගත කර ඇත. ඒකකයක විචල්‍ය පිරිවැය රු. 28 ක් වන අතර ඒකකයක ස්ථාවර පිරිවැය රු. 4 ක් වේ. සමාගම පිරිවැයෙන් 15% ක ලාභයක් උපයා ගැනීමට විකුණුම් මිල නියම කරනු ලැබේ.

ඔබ විසින් ගණනය කිරීමට අවශ්‍ය වන්නේ,

i. සමච්ඡේද ලක්ෂ්‍යයය

(ලකුණු 01)

ii. ලාභ /පරිමා අනුපාතය

(ලකුණු 02)

iii. විකුණුම් මිල 5% කින් අඩු වුවහොත්, වෙනස් වූ විකුණුම් මිල සමච්ඡේද ලක්ෂ්‍යයට සහ ලාභ/ පරිමා අනුපාතයට බලපාන්නේ කෙසේද ?

(ලකුණු 03)

iv. අයවැයගත ප්‍රමාණයට වඩා 10% කින් ලාභය වැඩි වුවහොත්, අඩු වූ මිල මත විකුණුම් කොපමණද ?

(ලකුණු 04)

ආ. සීමිත ජයකොඩි සමාගම සහ ලෙස භාණ්ඩ තුනක් නිෂ්පාදනය කරයි. මෙම භාණ්ඩ තුනම එකම අමුද්‍රව්‍යයය භාවිතා කරන අතර එය කිලෝ ග්‍රෑම් 61,000 ක් පමණක් පවතී. පහත තොරතුරු සමාගමේ පොත් සහ වාර්තා වල පැවතුණි.

| | A කාණ්ඩය | B කාණ්ඩය | C කාණ්ඩය |
|---|---|---|---|
| ඒකකයක විකුණුම් මිල | රු. 100 | රු. 140 | රු. 90 |
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු. 75 | රු. 110 | රු. 65 |
| ඒකකයකට අවශ්‍ය අමුද්‍රව්‍ය (කි.ග්‍රෑම්) | 5 | 8 | 6 |
| වෙළඳපොළ ඉල්ලුම - ඒකක | 5000 | 3000 | 4,000 |

වඩා ලාභදායි නිෂ්පාදන මිශ්‍රය පිළිබඳව සමාගමට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. පහත දත්ත 2012 වර්ෂය සඳහා සීමිත ආසිරි සමාගමේ පොත් සහ වාර්තා වලින් උපුටා ගන්නා ලද අතර එහි ආරම්භක තොගයක් නොපැවතුනි.

නිෂ්පාදනය ඒකක 5,500

<u>විචල්‍ය නිෂ්පාදන පිරිවැය :</u>

සෘජු ද්‍රව්‍ය (ඒකකයකට රු. 40 බැගින්) රු. 220,000

සෘජු ශ්‍රමය (ඒකකයකට රු. 20 බැගින්) රු. 110,000

විචල්‍ය පොදු කාර්යය ( ඒකකයකට රු. 10 බැගින් ) රු. 55,000

ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය රු. 110,000

විකුණුම් ඒකක 5000

විකුණුම් හා පරිපාලන වියදම්

විචල්‍ය ඒකකයකට රු. 10

ස්ථාවර රු. 20,000

ඒකකයක විකුණුම් මිල රු. 300

අවශ්‍ය වන්නේ,

අ. ආන්තික පිරිවැය ආදායම් ප්‍රකාශනයක් සහ අවශෝෂණ පිරිවැයකරණ ආදායම ප්‍රකාශනයක් පිළියෙල කිරීම.

(ලකුණු 14)

ආ. අවශෝෂණ පිරිවැයකරණය යටතේ සහ ආන්තික පිරිවැයකරණය යටතේ ලද ශුද්ධ ලාභ වල වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

06. අ. පෙරසැරි පිරිවැයකරණය යටතේ සාමාන්‍ය අලාභය, අසාමාන්‍ය අලාභය, අසාමාන්‍ය ලාභය සහ සුන්බුන් අගය යන සංකල්ප පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. 2012 මාර්තු මාසය සඳහා පෙරසරි 2 සම්බන්ධයෙන් පහත තොරතුරු පවතී.

ආරම්භය නොනිමි වැඩ ඒකක 600 - රු. 2625

නිමවූ ප්‍රතිශතය

අමුද්‍රව්‍ය 80%

ශ්‍රමය හා පොදු කාර්ය 60 %

පෙරසැරි 1 න් මාරු කිරීම : ඒකක 11,000 ක් රු. 13,750 කට

පෙරසැරි 3 ට මාරු කිරීම් : ඒකක 8800

පෙරසැරි 2 හි දැරූ පිරිවැය

සෘජු ද්‍රව්‍ය : රු. 6025

සෘජු ශ්‍රමය : රු. 17,887.50

නිෂ්පාදන පොදුකාර්යය : රු. 23,850

සුන්බුන් ඒකක : 1200

නිම වූ ප්‍රතිශතය : ද්‍රව්‍ය 100% ශ්‍රමය හා පොදු කාර්යය 70%

අවසාන තොගය : ඒකක 1600

නිම වූ ප්‍රතිශතය : ද්‍රව්‍ය 70%, ශ්‍රමය හා පොදුකාර්යය 60%

සාමාන්‍ය අලාභ නිෂ්පාදනයෙන් 10% ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. සුන්බුන් වූ ඒකක ඒකකයක් රු. 0.50 කට උපලබ්ධි විය.

පෙරසැරි සහ අනෙකුත් ගිණුම් ප්‍ර.ලැ.ප්‍ර.නි. (FIFO) ක්‍රමයට පිළියෙල කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)